# පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය පිළිබඳව සිසුන් තුළ පවත්නා ආකල්ප සහ අධ්‍යාපන සාධනය අතර ඇති සම්බන්ධතාවය සොයා බැලීමක්.

(ගම්පහ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ අ.පො.ස. උසස් පෙළ සිසුන් ඇසුරෙනි.)

අධ්‍යාපන දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා

ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධනය.


අධ්‍යාපන පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව.



UCLIB

403437



වීරසිංහ ආරච්චිගේ චාලට්

(ශාස්ත්‍රවේදී සාමාන්‍ය)

අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ඨ සම්මාන).


1986.08.30


CR

සංක්ෂේපයෙන් ........

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපන ආයතනයන්හි උසස් පෙළ පන්තිවල විද්‍යා/වාණිජ/කලා පාඨමාලා හදාරණ සිසු සිසුවියෝ මෙරට වර්තමාන පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය පිළිබඳ කෙබඳු ආකල්ප දරත්ද, එම ආකල්ප ඔවුන්ගේ සාධන මට්ටම කෙරෙහි කෙබඳු බලපෑමක් කරන්නේද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ විෂය ක්ෂේත්‍රය විය.

පුද්ගල ක්‍රියාකාරීත්වයේදී ආකල්පවලට වැදගත් ස්ථානයක් හිමිවන නිසාත්, සමාජයීය හා ආර්ථික වශයෙන් ඇතිවන ගැටළු මඟහරවා ගැනීමට පුද්ගල සාධනය ධනාත්මක තත්ත්වයට ගෙන ආයුතු නිසාත්, ආකල්ප, සාධනය වැනි සංකල්ප පිළිබඳව හැදෑරීම අතිශයින් වැදගත්වේ.

එනම් සිසුන්ගේ ක්‍රියාකාරීත්වය කෙරෙහි ආකල්පවල බලපෑම විශේෂයෙන් සැළකිය යුතු කරුණකි. උසස් අධ්‍යාපනය කෙරෙහි යතාර්ථ ආකල්ප සිසුන් තුළ වේ නම් ඔවුන් යහපත් නිෂ්ඨාවන් කෙරෙහි යොමු කරවීම පහසුවේ. සමාජයේ යහපත් ඉලක්ක කරා සිසුන් මෙහෙයවීමේදී ඔවුන්ගේ සහයෝගය ලබාගත යුතුවේ. ඒ සඳහා ඔවුන්ගේ ආකල්ප පිළිබඳව දැනගැනීම විශේෂයෙන් වැදගත්වේ. එබැවින් මෙවැනි මාතෘකාවන් පිළිබඳව විමසාබැලීම කාලෝචිත වේ.

මේ අනුව මෙම අධ්‍යයනයේ අරමුණු මෙසේ දැක්විය හැකිය. එනම්:-

සිසුන් පාසැල කෙරෙහි දක්වන ආකල්පයත් අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් තිබේදැයි සොයා බැලීම.

සිසුන් ගුරුවරයා කෙරෙහි දක්වන ආකල්පයත් අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් තිබේදැයි සොයාබැලීම.

සිසුන් අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්පයත් අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් තිබේදැයි සොයා බැලීම.

සිසුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි පවතින ආකල්පයත් අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතීදැයි සොයා බැලීම.

පාසැල් වර්ග අනුව සිසුන් පාසැල ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්පයත් අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතිදැයි සොයා බැලීම.

විද්‍යා/වාණිජ/කලා පාඨමාලා අනුව සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්පයත් අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතිදැයි සොයාබැලීම.

සමාජ පන්තිය අනුව සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්පයත්, අධ්‍යාපන සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතිදැයි සොයාබැලීම යනුවෙනි.

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ (1A,1B,1C හා පෞද්ගලික) පාසැල් 17 ක් අහඹු නියැදි කරණයෙන් තෝරා ගැණිනි. ඒ තුළින් පොකුරු නියැදි ක්‍රමයට තෝරාගත් (කලා/වාණිජ/විද්‍යා) සිසුහු 550 දෙනෙක් පර්යේෂණයේ නියැදිය වූහ.

සිසු ආකල්ප දැනගැනීමේදී පළමුව පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය පිළිබඳව ලයිකර්ට් පරිමාණයට අනුව සකසන ලද නියාමක ආකල්ප පරීක්ෂණ තුනක් අහඹු ලෙස තෝරාගත් සිසුන් 100 වෙත ඉදිරිපත් කර අදහස් ලබාගැණිනි. ඒ තුළින් ලත් දත්තයන්හි සම්බන්ධන සංගුණකයන් ගණනය කිරීමෙන් පසුව සංශෝධිත ආකල්ප පරීක්ෂණ තුන සැකසිණි. සාමාන්‍ය තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රවීනාචාර්ය-වරුන්ගේ උපදෙස් පරිදි ප්‍රශ්නාවලියක් සැකසිණි.

අ.පො.ස. උසස් පෙළ විභාගයේදී සිසුන් ලබාගත් සංකේතාත්මක වටිනාකම් පොදු නිර්නායකයක් තුළින් සංඛ්‍යාත්මක වටිනාකම් බවට පත් කිරීමෙන් ලබාගත් දත්ත සිසු සාධනය මැනීමේදී භාවිතයට ගැණිනි.

ආකල්ප හා සාධනය අතර පවතින සම්බන්ධතාවය විමසීම කයිවර්ග පරීක්ෂණ තුළින් ආපතිකතා වගු භාවිතයෙන් සිදු කෙරිණි. (එහිදී ධන හා ඍණ ආකල්ප ධන හා ඍණ සාධනය හා ගැලපීමක් ද සිදුවිය.) සාමාන්‍ය තොරතුරු විශ්ලේෂණයේදී ප්‍රතිශත භාවිතා විය.

මෙම ක්‍රියාවලියේදී ලත් ප්‍රතිඵල මෙසේ ඉදිරිපත් කළ හැකිවේ. එනම්,

නියැදිය සමස්ථයක් වශයෙන් ගත්විට පාසැල කෙරෙහි සිසුන් දක්වන ආකල්ප හා සාධනය! යන විචල්‍ය දෙක අතර සම්බන්ධතාවයක් පවතින බව කයිවර්ග පරීක්ෂණ තුළින් පෙන්නුම් නොකරයි.

නියැදිය උප කණ්ඩායම් වශයෙන් ගෙන බැලූ විට පිරිමි ළමයින්, කලා හා වාණිජ අංශ, 1AB, 1B හා 1C පාසැල්, සමාජ පන්තිය දෙක යන විචල්‍ය සඳහා පාසැල කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපාන බවත්, ගැහැණු ළමයින්, පෞද්ගලික පාසැල් හා සමාජ පන්තිය එක යන විචල්‍ය සඳහා පාසැල කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලනොපාන බවත්, කයිවර්ග පරීක්ෂණය පෙන්වා දේ.

එසේ වුවද, කයිවර්ග පරීක්ෂණයට අමතරව කරන ලද ප්‍රතිශත විශ්ලේෂණයෙන් හෙළිවූ පරිදි පාසැල කෙරෙහි ධන ආකල්ප දැරීම ධන සාධනය ඇතිවීම කෙරෙහිත්, ඍණ ආකල්ප දැරීම ඍණ සාධනය ඇතිවීම කෙරෙහිත් බලපාන්නේදැයි කීමට සාක්ෂි නැත.

නියැදිය සමස්ථයක් වශයෙන් ගත්විට ගුරුවරයා කෙරෙහි සිසුන් දක්වන ආකල්ප හා සාධනය යන විචල්‍ය දෙක අතර සම්බන්ධතාවයක් පවතින බව කයිවර්ග පරීක්ෂණ මගින් පෙන්නුම් කරයි.

නියැදිය උප කණ්ඩායම් වශයෙන් ගෙන බැලූවිට ගැහැණු හා පිරිමි ළමයින් 1A හා 1B පාසැල් සිසුන්, කලා වාණිජ හා විද්‍යා යන අංශවලට අයත් සිසුන්, සමාජ පන්තිය දෙකට අයත් සිසුන් යන විචල්‍ය සඳහා ගුරුවරයා කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපාන බවත් පෞද්ගලික පාසැල් සිසුන් 1C පාසැල් සිසුන් හා සමාජ පන්තිය එකට අයත් සිසුන් යන විචල්‍ය සඳහා ගුරුවරයා කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලනොපාන බවත්, කයිවර්ග පරීක්ෂණ පෙන්වා දේ.

එසේ වුවද, කයිවර්ග පරීක්ෂණයට අමතරව කරනලද ප්‍රතිශත විශ්ලේෂණයෙන් හෙළිවූ පරිදි ගුරුවරයා කෙරෙහි ධන ආකල්ප දැරීම ධන සාධනය ඇතිවීම කෙරෙහිත්, ඍණ ආකල්ප දැරීම ඍණ සාධනය ඇතිවීම කෙරෙහි පැහැදිලිවව බලපාන බව පැවසීමට ප්‍රමාණවත් සාක්ෂා නොමැත.

නියැදිය සමස්ථයක් වශයෙන් ගත්විට අධ්‍යාපනය කෙරෙහි සිසුන් දක්වන ආකල්ප හා සාධනය යන විචල්‍ය දෙක අතර සම්බන්ධතාවයක් පවතින බව කයිවර්ග පරීක්ෂණ තුළින් පෙන්නුම් කෙරේ.

නියැදිය උප කණ්ඩායම් වශයෙන් ගෙන බැලූවිට ගැහැණු ළමයින්, කලා අංශයේ සිසුන් 1A, 1B හා 1C පාසැල් සිසුන් හා සමාජ පන්තිය දෙකට අයත් සිසුන් යන විචල්‍ය සඳහා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපාන බවත්, පිරිමි ළමයින්, වාණිජ අංශයේ හා විද්‍යා අංශයේ සිසුන්, පෞද්ගලික පාසැල් සිසුන් හා සමාජ පන්තියකි එකට අයත් සිසුන් යන විචල්‍ය සඳහා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලනොපාන බවත් කයිවර්ග පරීක්ෂණ් මගින් පෙන්වා දේ.

එසේ වුවද, කයිවර්ග පරීක්ෂණවලට අමතරව කරනලද ප්‍රතිශත විශ්ලේෂණයෙන් හෙළිවූ පරිදි අධ්‍යාපනය කෙරෙහි ධන ආකල්ප දැරීම ධන සාධනය ඇතිවීම කෙරෙහිත් ඍණ ආකල්ප දැරීම ඍණ සාධනය ඇතිවීම කෙරෙහිත් පැහැදිලිවම බලපාන බව පැවසීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැත.

ගැහැණු ළමයින්ගේ සාධනය තීරණය කිරීමේලා ඔවුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප බලපා ඇති බව කයිවර්ග පරීක්ෂණ පෙන්වා දේ.

පිරිමි ළමයින් ගත්විට පාසැල හා ගුරුවරයා කෙරෙහි දක්වන ආකල්ප අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා බලපා ඇති බවත්, අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා බලපා නැති බවත් කයිවර්ග පරීක්ෂණ පෙන්නුම් කරයි. පෞද්ගලික පාසැල්වලට අයත් සිසුන් පාසැල ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා බලපා නැති බව කයිවර්ග පරීක්ෂණ මගින් පැහැදිලි කරයි.

එහෙත් 1AB පාසැල්වලට අයත් සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා බලපා ඇති බව කයිවර්ග පරීක්ෂණ පෙන්වා දේ.

1C පාසැල්වලට අයත් සිසුන් පාසැල හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපාන බවත්, ගුරුවරයා කෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපා නැති බවත් කයිවර්ග පරීක්ෂණ පෙන්නුම් කරයි.

කලා විෂයධාරාවට අයත් සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය තෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපා ඇතිබව කයිවර්ග පරීක්ෂණ තුළින් හෙළිවේ.

වාණිජ විෂයධාරාවට අයත් සිසුන් පාසැල හා ගුරුවරයා තෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපාන බවත් අධ්‍යාපනය තෙරෙහි දක්වන ආකල්ප, සාධනය තීරණය කිරීමේලා බලපා නැති බවත් කයිවර්ග පරීක්ෂණ මගින් පෙනේ.

විද්‍යා විෂයධාරාවට අයත් සිසුන් ගුරුවරයා තෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපා ඇති බවත් පාසැල හා අධ්‍යාපනය තෙරෙහි දක්වන ආකල්ප සාධනය තීරණය කිරීමේලා බලපා නැති බවත් කයිවර්ග පරීක්ෂණ වලින් පැහැදිලි වේ.

සමාජ පන්තිය එකට අයත් සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය තෙරෙහි දක්වන ආකල්ප අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා බලපා නැති බව කයිවර්ග පරීක්ෂණ මගින් පෙන්වා දේ.

එහෙත් සමාජ පන්තිය දෙකට අයත් සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය තෙරෙහි දක්වන ආකල්ප අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා බලපා ඇති බව කයිවර්ග පරීක්ෂණ මගින් හෙළිවේ.

ප්‍රශ්නාවලියෙන් ඉදිරිපත් වූ තොරතුරු තුළින් පැහැදිලිවන අයුරු සිසුන් තුළ ජනප්‍රිය පාසැල් සංකල්පය පිළිබඳව යහපත් ආකල්පයක් පවතින බව කිව හැකියි.

සිසුන් උපකාරක පන්ති වෙත තම විශේෂ අවධානය, විශ්වාසය තබා ඇති බව ප්‍රශ්නාවලියෙන් ලත් දත්ත තුළින් වැඩිදුරටත් පෙන්වා දිය හැකිය.

මේ අනුව පර්යේෂණය තුළින් බැසගත හැකි අවසාන නිගමනය සිසුන් පාසැල ගුරුවරයා හා අධ්‍යාපනය තෙරෙහි දරන ආකල්ප ඔවුන්ගේ අධ්‍යාපන සාධනය තීරණය කිරීමේලා කිනම් ආකාරයක හෝ බලපෑමක් කරන බවය.

------

UNIVERSITY OF COLOMBO LIBRARY